# TRANSPORTATION, WAREHOUSING & LOGISTICS (Part-I)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# ප්‍රවාහනය

එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට විවිධ මාධ්‍ය භාවිත කරමින් පුද්ගලයින් හෝ ද්‍රව්‍ය ගෙන යාමේ ක්‍රියාවලිය ප්‍රවාහනයයි.

ව්‍යාපාර කටයුතුවල සාර්ථකත්වයට ප්‍රවාහනය අත්‍යවශ්‍ය උපකාරක සේවාවකි.

ප්‍රවාහනය හුදෙක් මාධ්‍යයක් පමණක් නොව මූලිකාංග කිහිපයකින් සමබර ව සංවර්ධනය වීමෙන් සැකසුණු පද්ධතියකි.

ප්‍රවාහනයේ තුලිත සංවර්ධනයක් සඳහා ප්‍රවාහන මූලිකාංගවල වර්ධනයක් හෙවත් සුලභතාවක් අවශ්‍ය වේ.

ClassWork.LK

# ප්‍රවාහන පද්ධතියක මූලිකාංග

## මාර්ගය (Way)

ප්‍රවාහනය සඳහා භාවිත කරන විවිධ මාර්ග වේ.

**නිදසුන්**

මහා මාර්ග, දුම්රිය මාර්ග, ජල මාර්ග, ගුවන් මාර්ග

## මාධ්‍යය (Mode)

විවිධ මාර්ගවල ධාවනය වන වාහන වේ.

**නිදසුන්**

මෝටර් රථ, දුම්රිය, නැව්, ගුවන් යානා

## බලය (Power)

එක් එක් මාධ්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ඉන්ධන වර්ගය හෝ ශක්තිය වේ.

**නිදසුන්**

ගල් අඟුරු, ඛණිජ තෙල්, විදුලිය, ගෑස්

ClassWork.LK

# පර්යන්තය

ප්‍රවාහන මාධ්‍ය, ප්‍රවාහන කාර්යයේ දී නවතා (Terminal) තබන නැවතුම්පොළවල් වේ.

**නිදසුන්**

බස් නැවතුම්පොළ, දුම්රිය ස්ථානය, ත්‍රී රෝද රථ නැවතුම්පොළ

ClassWork.LK

# ප්‍රවාහන මූලිකාංග හා නිදසුන්

| මාර්ගය **Way** | මාධ්‍ය **Mode** | බලය **Power** | පර්යන්තය **Terminal** |
|---|---|---|---|
| මහා මාර්ග<br>High Ways | කරත්ත,<br>මෝටර් රථ,<br>බයිසිකකල්,<br>ලොරි,<br>බස් රථ | මිනිස් ශ්‍රමය,<br>සත්ව ශ්‍රමය,<br>ඩීසල්, පෙට්‍රල්,<br>ගෑස්, විදුලිය | බස් නැවතුම්පොළ<br>Bus Stand |
| දුම්රිය මාර්ග<br>Rail Ways | දුම්රිය<br>ඩක්කුව | ගල් අඟුරු<br>ඩීසල්, විදුලිය | දුම්රිය ස්ථානය<br>Railway Station |
| ගුවන් මාර්ග<br>Air Ways | ගුවන් යානා<br>හෙලිකොප්ටර් | පෙට්‍රල් | ගුවන් තොටුපොළ<br>Airport |
| ජල මාර්ග<br>Water Ways | නැව්<br>බෝට්ටු<br>ඔරු | සුළඟ<br>ඩීසල්<br>මිනිස් ශ්‍රමය | වරාය<br>Harbour<br>තොටුපොළ<br>port |

Class Work.LK

# එක් එක් ප්‍රවාහන ක්‍රමයේ වාසි හා අවාසි

## මහා මාර්ග ප්‍රවාහන ක්‍රමයේ වාසි

- අවශ්‍යතාවට ගැලපෙන සේ මාධ්‍යයක් තෝරාගත හැකි වීම
- රට පුරා ව්‍යාප්ත ව පැවතීම
- අවශ්‍ය ඕනෑ ම විටක මහා මාර්ග භාවිත කළ හැකි වීම
- බොහෝ විට ගමනාන්තය දක්වා ම එක ම ප්‍රවාහන මාධ්‍යයක් යොදා ගත හැකි වීම

## මහා මාර්ග ප්‍රවාහන ක්‍රමයේ අවාසි

- විශාල තොග එකවර ප්‍රවාහනයට අපහසු වීම
- මහාමාර්ග නඩත්තු පිරිවැය අධික වීම
- ප්‍රමාදය හා අනතුරු ඉහළ වීම
- කාලගුණික තත්ත්ව මත බාධා ඇති වීම

ClassWork.LK

# දුම්රිය ප්‍රවාහන ක්‍රමයේ වාසි

- විශාල භාණ්ඩ තොග හා මගීන් විශාල සංඛ්‍යාවක් එකවර ප්‍රවාහනය කළ හැකි වීම

- මහාමාර්ග ප්‍රවාහනයට වඩා ආරක්ෂාකාරී වීම

- භාණ්ඩවල ස්වභාවය අනුව මැදිරි යොදා ගත හැකි වීම

- සෙසු ප්‍රවාහන මාධ්‍ය හා සසඳන කල ගාස්තු අඩු වීම

- ආපනශාලා, නිදන මැදිරි, නිරීක්ෂණ මැදිරි ආදී විවිධ පහසුකම් ලබා ගත හැකි වීම

ClassWork.LK

# දුම්රිය ප්‍රවාහන ක්‍රමයේ අවාසි

- දුම්රිය මාර්ග දිවයින පුරා ව්‍යාප්ත ව නො තිබීම

- අවශ්‍ය ඕනෑ ම වේලාවක දී සේවය ලබා ගත නො හැකි වීම

- ගමනාන්තය දක්වා යොදා ගත නො හැකි නිසා වෙනත් ප්‍රවාහන ක්‍රම ද යොදා ගැනීමට සිදු වීම

- විදුලි සංඥා ඇණ හිටීම, දුම්රිය මාර්ග අබලන් වීම ආදිය නිසා ප්‍රමාද ඇති වීම

ClassWork.LK

## ජලමාර්ග ප්‍රවාහන ක්‍රමයේ වාසි

- අන්තර්ජාතික වෙළෙඳාමට සහාය වීම
- භාණ්ඩ විශාල ප්‍රමාණයක් එකවර රැගෙන යා හැකි වීම
- භාණ්ඩ වර්ගවල ස්වභාවය අනුව යාත්‍රා තෝරාගත හැකි වීම

## ජලමාර්ග ප්‍රවාහන ක්‍රමයේ අවාසි

- නැව් සේවාව සුලභ නො වීම
- වැඩි කාලයක් ගත වීම

ClassWork.LK

## ගුවන් ප්‍රවාහන ක්‍රමයේ වාසි

- වේගවත් බව අතින් ඉහළ වීම
- ඉක්මණින් නෂ්‍ය වන භාණ්ඩ සඳහා යෝග්‍ය වීම
- මාර්ග නඩත්තු පිරිවැයක් නො මැති වීම

## ගුවන් ප්‍රවාහන ක්‍රමයේ අවාසි

- විශාල හා බරින් අධික භාණ්ඩ ප්‍රවාහනය සඳහා යෝග්‍ය නො වීම
- ප්‍රවාහන පිරිවැය අධික වීම
- අනතුරු වීමට ඇති ප්‍රවණතාව වැඩි වීම
- අවශ්‍ය වේලාවට සපයා ගැනීමට නො හැකි වීම

ClassWork.LK

# ප්‍රවාහනයේ වැදගත්කම

ආර්ථික හා සමාජ සංවර්ධනයේ සහ ගෝලීයකරණයේ ප්‍රධාන ම උපාංගය වනුයේ ප්‍රවාහනයයි. නිෂ්පාදිතවල නිෂ්පාදනය හා පාරිභෝජනය වෙනස් ස්ථානයන්හි සිදුවන්නේ ප්‍රවාහනය නිසා ය.

ප්‍රවාහනය වෙළෙඳාමේ ව්‍යාප්තියටත්, පුද්ගලයින්ගේ පැතිරීමටත් විශාල වශයෙන් හේතු වේ. මේ අනුව විවිධ පාර්ශ්වවලට ප්‍රවාහනය වැදගත් වන ආකාරය පහත පරිදි දැක්විය හැකි ය.

# ප්‍රවාහනය ව්‍යාපාරිකයාට වැදගත් වන ආකාරය

- අමු ද්‍රව්‍ය කලට වේලාවට සපයා ගැනීමට
- නිමි ද්‍රව්‍ය කලට වේලාවට වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමට
- සේවකයින් නියමිත වේලාවට ගෙන්වා ගැනීමට
- ව්‍යාපාරික සබඳතා පැවැත්වීමට
- වෙළෙඳපොළ ව්‍යාප්තියට

ClassWork.LK

## ප්‍රවාහනය පුද්ගලයන්ට වැදගත් වන ආකාරය

- සමාජ සබඳතා ඇති කර ගැනීමට හා පවත්වා ගෙන යාමට
- රැකීරක්ෂා හා සංචරණය සඳහා
- විනෝදාස්වාදය සඳහා
- පර්යේෂණ, ගවේෂණ හා අධ්‍යාපන කටයුතු සඳහා

## ප්‍රවාහනය ආර්ථිකයට වැදගත් වන ආකාරය

- සේවා නියුක්තිය වර්ධනය වීම
- ජාත්‍යන්තර සබඳතා වර්ධනය වීම
- විදේශ වෙළෙඳාම වර්ධනය වීම

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura